මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ඉතිහාසය | 6 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..........................................................................................................

## I පත්‍රය

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දී ඇති වරණ අතරින් නිවැරදි වරණය තෝරා ගෙන යටින් ඉරක් අඳින්න.

01. ඉතිහාසය ගැන අපට දැනුම ලබා ගැනීමට උපයෝගි වන සෑම දෙයක්ම හැඳින්වීමට යොදන පොදු නම,
    i. පොත්පත්  iii. මූලාශ්‍රය
    ii. නටඹුන්  iv. මෙවලම්

02. අපේ රටේ ඉතිහාසය ඉගෙන ගැනීමට ඇති පැරණිම මූලාශ්‍රය,
    i. දීප වංසය  iii. චූල වංසය
    ii. මහාවංසය  iv. නිකාය සංග්‍රහය

03. මහා වංසය රචනා කරන ලද හිමියන් කවුරුන්ද
    i. දික්සඳ පිරිවෙන් වාසි මහානාම හිමි  iii. ධර්මසේන හිමි
    ii. බුද්ධඝෝෂ හිමි  iv. ගුරුළුගෝමී පඬිවරයා

04. බුදුන් වහන්සේගේ උප්පත්තිය මුල් කරගෙන ආරම්භ වන වර්ෂ ක්‍රමය,
    i. ක්‍රිස්තු වර්ෂ  iii. ශක වර්ෂ
    ii. බුද්ධ වර්ෂ  iv. හිජ්රි වර්ෂ

05. පළමු වරට ගොඩබිම පහළ වූයේ,
    i. සතුන් ය.  iii. මැමත් අලින් ය.
    ii. ගස්වැල් ය.  iv. බැක්ටීරියාවන් ය.

06. මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිතා කිරීමේ සාක්ෂි ලැබුණු රට කුමක්ද?
    i. චීනය  iii. ඉන්දියාව
    ii. ඊශ්‍රායලය  iv. අරාබිය

07. වඩා සාරවත් දේ නිපද වූ මානවයා හැඳින්වූයේ,
    i. හෝමෝ සාපියන්  iii. පිකිං මානවයා
    ii. හෝමෝ ඉරෙක්ටස්  iv. හෝමෝ හැබිලස්

08. වානරයෙකු බිහිවීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,
    i ඉතිහාසයේ විකාශනය යනුවෙනි  iii සත්ත්ව පරිණාමය යනුවෙනි
    ii මානව විකාශනය යනුවෙනි  iv මානව පරිණාමය යනුවෙනි

09. පහත යුග අතරින් ඇටසැකිලි මත වර්ණාලේප කිරීමේ අවමංගල්‍ය චාරිත්‍රය සිදු කළ යුගය,
    i. පුරාශිලා යුගය  iii. නව ශිලා යුගය
    ii. මධ්‍ය ශිලා යුගය  iv. හෙලෝසීන යුගය



LIVEWORKSHEETS

10. වී වගාව මුල් වරට ආරම්භ වූ රට ලෙස සැලකෙන්නේ,

i. ලංකාවයි
ii. ඉන්දියාවයි
iii. මෙක්සිකෝවයි
iv. චීනයයි

11. මහසෙන් රජතුමා විසින් ඉදිකරන ලද වැවක් වන්නේ,

i. කන්තලේ වැවයි
ii. පදවිය වැවයි
iii. මින්නේරිය වැවයි
iv. කලා වැවයි

12. බසවක්කුලම වැව ඉදිකරන ලද්දේ,

i. පණ්ඩුකාභය රජු
ii. වසභ රජු
iii. පඬුවස්දෙව් රජු
iv. මහසෙන් රජු

13. ඔපබිනියාවෙකුගේ පාෂාණ භූත සලකුණක් සොයා ගෙන ඇත්තේ කුමන රටින්ද?

i කැනඩාව
ii චීනය
iii ජපානය
iv ඉන්දියාව

14. පණ්ඩුකාභය රජතුමා විසින් තම අගනුවර ලෙස තෝරා ගනු ලැබුවේ,

i දීඝගාමයයි
ii උපතිස්ස ගාමයයි
iii උරුවෙල ගාමයයි
iv අනුරාධ ගාමයයි

15. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත් කර ඇත්තේ,

i රුවන්වැලිසෑයේ ය.
ii මිරිසවැටියේ ය.
iii අභයගිරියේ ය.
iv ථූපාරාමයේ ය.

16. සඝමිත්තෙරණි ගොඩබට වරාය වනුයේ,

i. ගෝකණ්ණ
ii. දඹකොළපටුන
iii. මාතොට
iv. ලංකාපටුන

17. ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය ඇරඹුණේ කවුරුන්ගෙන් ද?

i. සුගලා දේවියගෙනි
ii. අනුලා දේවියගෙනි
iii. අරිට්ඨ කුමරුගෙනි
iv. ස්වර්ණපාලී කුමරියගෙනි

18. දේවානම්පියතිස්ස රජතුමා භික්ෂූන් වහන්සේලාට දානය පිරිනැමීමට ඉදිකළ ආරාමය,

i. තිස්සාරාමය නමිනි
ii. ලහබත්ගේ නමිනි
iii. මහාවිහාරය නමිනි
iv. මහබෝ ගෙය නමිනි

19. ථූපාරාමය පළමු වරට ඉදිකළේ මින් කුමන හැඩයෙන් ද?

i. ධාන්‍යාකාර
ii. බුබ්බුලාකාර
iii. ඝණ්ටාකාර
iv. ඝටාකාර

20. මිහිඳු මහ රහතන් වහන්සේ සමග පැමිණි පිරිස අතර සිටි සාමනේර හිමි නම කවුරුන්ද?

i. ඉට්ඨිය
ii. බද්දසාල
iii. සුමන
iv. උත්තිය



LIVEWORKSHEETS